ඊලාම් යුද්ධය හා සොල්දාදුවන්ගේ මානසික සෞඛ්‍යය

පස්වන කොටස



වෛද්‍ය රුවන් එම්. ජයතුංග

මම සතුරු සීමාවන් දෙසට ඇවිදගෙන ගොස් සිටියෙමි. - සාමාන්‍ය සෙබළ -SK

''මා ව්‍යාකූල තත්ත්වයකට පත්ව සිටි අතර කරන්නේ කුමක්ද කියාවත් හැඟීමක් නොතිබින. මා සතුරු සීමාවන් දෙසට ඇවිද ගොස් සිටියෙමි. වාසනාවකට මෙන් විශේෂ කාර්ය බලකා කණ්ඩායමක් විසින් මා බේරාගති. ඔවුන් මා සොයා ගන්නා විට යුද අවිය බිම තබා සතුරු සීමාව දෙසට යමින් සිටියෙමි. මගේ ආරක්ෂක ස්ථානයෙන් ඉවත්ව ගියේ කෙසේද කියා හෝ T56තුවක්කුව බිම දැමුවේ කෙසේද යන්න මට මතක නැත. මා කඳවුරට ගෙන යන ලදුව කර්නල්..... ඉදිරියට පමුණුවන ලදී. පසුව මගේ සේවා ස්ථානය අත්හැර දැමීම හා ආයුධය නැති කිරීම ගැන ඔවුහු මට චෝදනා කළහ. එම වරදට මට තදබල දඬුවම් දෙන ලදී.

(දරාගත නොහැකි යුද්ධයට අදාළ තාතතිය නිසා සාමාන්‍ය සෙබළිණ මනෝ ප්‍රතිසංවේදී (Psyshogenic fugue) භාවයකට පත්ව සිටියේය. එදින සිදුවූ දේ පිළිබඳව ඔහුට යළි සිහි නගා ගත නොහැකි විය. නැදුන්කර්නියේ සේවය කරන විට කාලතුවක්කු වෙඩිතැබීම් නිසා සෙබලුන් හතර දෙනෙකු ජීවිතක්ෂයට පත්වෙනු ඔහු දුටුවේය. ඔවුන්ගේ සිරුරු කැබලි වලට කැඩී විසිවී ගිය ආකාරය දුටු ඔහු දැඩි සේ කම්පනයට පත් විය. මෙම සිද්ධියෙන් පසුව ඔහු ක්‍රමයෙන් සටහට අදාළ PTSD තත්වයේ ගොදුරක් බවට පත්ව සිටියද එය නිර්ණය නොවී හා එයට ප්‍රතිකාර නොකර තත්ත්වයක තිබින. ඔහුට සමාජයෙන් වෙන්වී සිටීමේ ලක්ෂණ ද තිබින. කිහිප අවස්ථාවක් ඔහු ප්‍රතිසංවේදී තත්ත්වයක සිට අන්තිමේදී ඔහු සතුරු සීමාවන් කරා ගමන් කොට ඇත. ඔහුව බේරා ගන්නා ලද පසුව සාමාන්‍ය සෙබළ SK ව කොළඹ යුද හමුදා රෝහලේ මනෝචිකිත්සක ප්‍රතිකාර මධ්‍යස්ථානයට යොමු කරන ලදී. එහිදී ඔහු මනෝ චිකිත්සක පරීක්ෂාවන් පෙළකට හා සන්නිවේදන පරීක්ෂා ක්‍රමයක පාත්‍ර කරන ලදී. මේ පරීක්ෂණ කරන ලද්දේ ස්වයං පිබිදීම් (autonomic arousal)හෙළිකර ගැනීම සඳහාය. ඔහුට ජඹීෘතත්ත්වය ඇති බව සොයා ගන්නා ලදී. ඔහුට SSRI හා (SPDP)කෙටිකාලීන මානසික ගති විද්‍යාත්මක චිකිත්සාව ලබා දෙන ලදී. මෙම ප්‍රතිකාරයත් සමග ඔහුගේ මානසික තත්ත්වය දියුණු වීමට පටන් ගති.

PTSD තත්ත්වය සහිත යුද සිරකරුවන්

තවමත් මානසික කැලඹි සහිතව ජීවත්වන ඊලාම් යුදයේ යුද සිරකරුවන් රාශියක් අප අතර ජීවත් වේ. 1950 දී Farber Harlew විසින් විස්තර කනර ලද DDD ඉහ ලක්ෂයෙන් ඔවුහු පීඩා විඳිති. DDD සහ ලක්ෂ්‍යතය යනු debility, dependencyyd dread -දුර්වලකම, පරාජිත බව හා සංතාපය යන්නයි. යුද සිරකරුවන් බොහෝ විට විෂාදිය, උදාසීන බව, සැකය හා බිය යන ලක්ෂණ පෙන්නුම් කරයි. සමහරුන්ට තද බල ලෙස අමතක වීම් සිදුවන අතර තවමත් ඔවුන්ගේ යුධ සිරකරුව සිටි කාලය පිළිබඳ වරදකාරී හැඟීමකින් පසුවේ.

වසර නවයකට ආසන්න කාලයක් තුල ඔහු LTTE යටතේ සිරකරුවෙකු ලෙස කල් ගෙවීය. ඔහු නිතරම තම නිවෙස ගැන සිතමින් දුක්වූ අතර තම නිදහස පතා යාඥා කළේය.

ලාන්ස් කෝප්රල් U වසර 17 ක් ශ්‍රී ලංකා යුද හමුදාවේ සේවය කළේය. ''බලවේගය'' මෙහෙයුමේදී ඔහුගේ වම් පාදයට වෙඩි වැදීම නිසා සිදුවූ තුවාලයෙන් ඔහුට ඇවිදිය නොහැකි විය. සතුරා ඉදිරියට එන විට ඔහුට ඇවිදගත නොහැකි වූයෙන් ඔහු සිරකාරයෙකු බවට පත්විය. ඔහු අල්ලාගත් පසු දැඩි ලෙස පහර දෙන ලද අතර, ඔහුව මරා දමන බවට ද තර්ජනය කරන ලදී. එහෙත් LTTE නායකයකු විසින් ඔහුට පහරදීම නතර කොට වෛද්‍ය ප්‍රතිකාර සඳහා යවන ලදී.

වෛද්‍ය ප්‍රතිකාර නිමාවු පසු ඔහුව දැඩි ප්‍රශ්න කිරීමේ ක්‍රියාවලියට යටත් කරන ලදී. ඔහුගේ කඳවුර හා එහි ඇතුළත නිර්මානය හා ආරක්ෂක ස්ථාන ගැන කරුණු දැනගනු පිණිස ඔහුව කෘර වධහිංසා වලට භාජනය කරනලදී. ඔහුගේ අත්වලට මාවු දමා වේදනාකාරී ඉරියව්වලින් තමන ලදී. බොහෝ විට මුරකරුවන් ඔහුට කායික වධහිංසා දී ඔහුව අවමානයට ලක් කලේය. එහෙත් සමහර කොට සාමාජිකයින් ඔහුව කරුණාවන්ත වී ආහාර ද ගෙනවිත් දුන් බව ලාන්ස් කෝප්රල් U ප්‍රකාශ කළේය.

1991 ජූලි මස සිට 1995 මාර්තු දක්වා, කායික වධ හිංසාවන්, අවමන් කිරීම් හා අවිනිශ්චිතතාවයන්ට මුහුණ දෙමින් ඔහුගේ ජීවිතය යුද සිරකරුවෙකු ලෙස ගත කළේය. ඔහුව තවත් සිරකරුවන් 40 දෙනෙකු සමග රඳවා තබන ලදී. ඔවුන්ට එහා මෙහා වීමටවත් ඉඩ නොතිබුණි. ඔවුන්ට ස්නානය කිරීමට ඉඩ ලැබුනේ සති දෙකකට එක් වරක් පමණි. සමහරවිට ඊටත් වඩා දිගු කළක් හිඳීමට සිදුවිය. බොහෝ දෙනෙකු සමේ රෝගවලින් පෙලුනි. ඔහුගේ ආහාර දෛනිකව ලබා නොදෙන ලදී. මෙම දැරිය නොහැකි තත්ත්වයන්ගේන පසුව සිරකරුවන් විසින් උපවාසයක් අරඹන ලද අතර අන්තිමේදී ජාත්‍යන්තර රතුකුරුස කමිටුවේ (ICRC) මැදිහත්වීමෙන් 1995 මාර්තු මස නිදහස් කරන ලදී.

ලාන්ස් කෝප්රල් U නිදහස් මිනිසෙකු බවට පත්වුවද ඔහු විස්තර කළ නොහැකි බියකින් නිතරම පෙලුනි. ඔහුගේ යුද සිරකරු කාලය පිළිබඳ මතකයන් දැඩිසේ ඔහු පෙළිය. සමහර රාත්‍රී කාලවලදී තමන් තවමත් LTTE හිර කුටියක සිටිය යන හැඟීමෙන් යුතුව ඔහු බියෙන් අවදි විය. ඔහු විෂාදියට පත්වූ අතර වරදකාරී හැඟීම වලින් ඔහු වටවිය. රාත්‍රී බියකරු සිහින දැකීම වලකනු පිණිස ඔහු මත්පැන් පානයට පුරුදු විය. මත්පැන් පානය වැඩිවත්ම ඔහු තව තවත් කළ කිරීමට පත් විය. ඔහු නිතරම බිරිඳට කායික වදහිංසා දුන්නේය. ඔහුගේ කම්පනකාරී අත්දැකීම් වලට සම්බන්ධ සියලුම දෙයින් ඉවත්වීමට ඔහු පටන් ගත්තේය.

වටපිටාව ගැන ඔහු සැක පහල කළේය. විශ්වාසය තැබීමේ හැකියාව ඔහුට නැති වූ අතර මිතුශීලීවීමටද නොහැකි විය. භාවමය නිර්වින්දනීය බවින් ඔහුට බලපෑම් ඇති විය. ඔහුට අතීතාවර්ජනයක් අති වූ අතර සමහර අවස්ථාවලදී යථාර්ථය හා මයාව වෙන් කොට හඳුනාගත නොහැකි විය. ඔහුගේ කායික ශක්තිය දුර්වල වන්නට පටන් ගත් අතර, ඉතාම සුළු වෙහෙසීමකදී පවා සිරුරේ තදබල වේදනාවක් හටගත්තේය. 2003 වසරේදී ඔහුට PTSD තත්ත්වය ඇති බවට නිර්ණය කරන ලදී.

පුනරින් කඳවුරේ අරක්කැමියා

N නම් සිවිල් වැසියා පුනරින් කඳවුරේ අරක්කැමියෙකු ලෙස සේවය කළේය. 1993 දී LTTE ය කඳවුරට පහරදුන් අවස්ථාවේදී බොහෝ දෙනෙකුගේ ජීවිත විනාශ විය. සතුරාගෙන් ගැලවීම සඳහා ඔහු ගොඩනැගිලි සංකීර්ණයේ සැඟවී සිටි අතර පසුව LTTE සාමාජිකයින්ගේ ග්‍රහණයට හසු විය. ඔහුට පහරදෙන ලද අතර එතැනදීම මරාදමන බවටද තර්ජනය කරන ලදී. වෙස් මාරුකරගෙන සිටින නිලධාරියෙකු ලෙසින් ඔහුව වරදවා හඳුනාගන්නා ලදී. ඔහුට විවිධ අන්දමේ දැඩි කායික හා මානසික වදහිංසා පමුණුවන ලදී. අන්තිමේදී රතුකුරුස සංවිධානයේ මැදිහත්වීමෙන් ඔහුගේ නිවැරදි අනන්‍යතාව ඔප්පු කරන ලදී.

වසර නවයකට ආසන්න කාලයක් තුල ඔහු LTTE යටතේ සිරකරුවෙකු ලෙස කල් ගෙවීය. ඔහු නිතරම තම නිවෙස ගැන සිතමින් දුක්වූ අතර තම නිදහස පතා යාඥා කළේය. තම අනාගතය කුමක් වේදැයි නොදැන ඔහු බොහෝ කලක් අසීරුතාවකින් යුතුව කල්ගත කළේය. ගුවන් හමුදාව මගින් LTTE කඳවුරු වලට පහරදුන් විට LTTE සාමාජිකයින් සිරකරුවන්ට දැඩිසේ හිරිහැර කිරීමට පුරුදු වී සිටියහ. ශ්‍රී ලංකා නාවික හමුදාවේ යුද සිරකරුවෙකු වූ කපිතාන් බෝයගොඩ මුනගැසුනු පසුව ඔහුගේ තත්ත්වය කැපී පෙනෙන අන්දමින් වෙනසකට භාජනය විය. 1994 වසරේදී මුහුදු කොටින් විසින් ඔහුගේ නැව වූ ''සාශරවර්ධන'' නෞකාවට පහරදුන් අවස්ථාවේදී කපිතාන් අජිත් බෝයගොඩ යුද සිරකරුවෙකු බවට පත් විය. පැවති අසීරු තත්ත්වයන්ට මුහුණ දීම සඳහා කපිතාන් බෝයගොඩ ඔහුට ශක්තිය හා ධෛර්ය ලබා දුන්නේය. වෙනත් යුද සිරකරුවන්ද සමග ඔහු ඔහුගේ නිදහස්වීම ගැන සාකච්ඡා කරමින්ද ICRC ජාත්‍යන්තර රතුකුරුස කමිටුව හරහා නිවෙසට ලිපි ලියමින්ද කාලය ගත කළේය.

2002 වසරේ සැප්තැම්බර් මස 30 වන දින ඔහුව නිදහස් කරන ලදී. නිදහස්වීමෙන් පසුව ආතතියට අදාල කායික රෝග ලක්ෂණ වන හිසේ රුදාව, පිටෙහි කැක්කුම වැනි වේදනානාශක වලින් සුව කළ නොහැකි ආබාධ වලින් ඔහු පෙළෙන්නට විය. ඔහුට නිදාගත නොහැකි විය. රාත්‍රී කාලයේදී ඔහු අවදිව අතීතය ගැන සිතන්නට පටන් ගති. ඔහුට නිතරම ඩොමිනස් සහගත සිතිවිලි පහල වූ අතර චිත්ත වේගයන් නොදැනීම පිළිබඳව කරදරයට පත් විය. තමන් නිදහස් පුද්ගලයෙකු බවට පත්වීමේ නිදහස පිළිබඳ සතුට ඔහුට නොදැනුනි. ඔහුගේ හැඟීම් මියගොස් තිබුනි. ජීවත්වීමට තිබි කැමැත්ත නැතිවෙමින් පැවතින. කිහිප වතාවක් ඔහු සියදිවි හානිකර ගැනීම තැත් කළේය.

මානසික චිකිත්සාවට ඔහුව යොමු කරන ලද අතර කිරන ලද පරීක්ෂණයකින් ඔහු තුල බොහෝ දේහික රෝග ලක්ෂණ දක්නට ලැබින. කම්පනකාරී රෝග ලක්ෂණ තිබුනද මානසික හා ඖෂධිය ප්‍රතිකාර වලට ඔහු ප්‍රතිචාර දැක්විය. ක්‍රමක්‍රමයෙන් ඩොමිනස්සහගත හැඟීම් චිත්තරූප බලෙන් ඇතුල්වීම හා මනෝදේහික ආබාධ වලින් මිදෙන්නට ඔහුට හැකිවිය. බොහෝ මනෝසමාජීය සහනයක් ලැබීමට තරම් ඔහු වාසනාවිත විය. සෙලින්කෝ සමූහ ව්‍යාපාරයෙන් ඔහුට නිවසක්ද ලැබින. මේ වන විට ඔහු බොහෝ දුරට රෝග ලක්ෂණ වලින් මිදුනු ඵලදායී දිවියක් ගෙවන පුද්ගලයෙකු බවට පත්ව ඇත.